# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,925/3 — 1970 සැප්තැම්බර් 30 වැනි බදාදා— 1970.9.30

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජ සභා ආඥාව

**47 (2) වෙනි වගන්තිය යටතේ නිවේදනය යි**

1959 අංක 4 දරන පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජ සභා ආඥාවෙහි 47 වෙනි වගන්තියේ (2) වෙනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය සිරිමාවෝ රත්වත්තේ ඩයස් බණ්ඩාරනායක වන මම, 1959 අංක 8 දරන පනතින් සංශෝධිත (40 වැනි අධිකාරය වන) මහාජන ආරක්ෂක ආඥාපනතේ III වැනි කොටසින් මා වෙත පැවරී ඇති හෝ නියමව ඇති සියලු බලතල හා යුතුකම් , මා ලංකාවෙන් බැහැර සිටින කාලය තුළ, මාගේ පාර්ලිමේන්තු ලේකම් ජයකොඩි ආරච්චිගේ ලක්ෂ්මන් ජයකොඩි මහතා වෙත මෙ නිවේදනයෙන් පවරමි.

සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක,
අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය.

1970 සැප්තැම්බර් මස 30 වැනි දින,
කොළඹදී ය.

9–279/1

---

### මහජන ආරක්ෂක ආඥාපනත

(40 වෙනි අධිකාරය වන) මහාජන ආරක්ෂක ආඥාපනතෙහි 5 වෙනි වගන්තිය යටතේ මා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර, අග්‍රාමාත්‍ය සිරිමාවෝ රත්වත්තේ ඩයස් බණ්ඩාරනායක වන මම, මා ලංකාවෙන් බැහැරව සිටින කාලය තුළ ඉහත කී 5 වෙනි වගන්තිය යටතේ මා වෙනුවෙන් වැඩ බැලීමට විදේශීය හා දේශීය වෙළඳ ඇමතිට මෙයින් බලය පවරමි.

සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක,
අග්‍රාමාත්‍ය.

1970 සැප්තැම්බර් මස 30 වන දින,
කොළඹදී ය.

9–279/2


ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

722/5——ජේ 17220—10,775 (70/9)